# (ඌ) ජාත්‍යන්තර ගනුදෙනු හා විදේශීය වත්කම්.

ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු හා විදේශීය වත්කම් පිළිබඳ විස්තරාත්මක සංඛ්‍යා තොරතුරු දෙවැනි පරිශිෂ්ටයේ 27 සිට 31 තෙක් ඇති සංඛ්‍යා සටහන් වලින් දැක්වෙයි. විනිමය පාලන වාර්තාවලින් ලබාගන්නා ලද නියම ලැබීම් හා ගෙවීම් සංඛ්‍යා අනුව ජාත්‍යන්තර ගනුදෙනු පිළිබඳ සංඛ්‍යා තොරතුරු සකස්කර ඇත.

**ප්‍රධාන හැඩගැස්ම.**

පසුගිය වර්ෂයන් සමග සසඳ බලන කල, 1964 දී ලංකාවේ ගෙවුම් ශේෂයෙහි මිශ්‍ර හැඩගැස්මක් පිළිබිඹු විය. වෙළෙඳ භාණ්ඩ ගිණුමේ ශේෂය රුපියල් කෝටි 3·2 කින් රුපියල් කෝටි 19·30 දක්වා පහළ වැටුනේය. එහෙත් අදිසි ශේෂයෙහි තිබූ රුපියල් කෝටි 0·66 ක හිඟය පියවී රුපියල් කෝටි 4·58 ක අතිරික්තයක් ඇතිවූ හෙයින් 1963 දී රුපියල් කෝටි 16·76 ක්ව තිබූ මුළු වර්තන ගිණුම් හිඟය 1964 දී රුපියල් කෝටි 14·76 දක්වා අඩුවූයේය. එසේ වුවද දීගු කාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් සඳහා ගලපන ලද වර්තන ගිනුම් ශේෂයෙන් පිළිබිඹු කැරුන, "මූලික ගෙවුම් ශේෂ තත්ත්වයෙහි" දියුණුවක්

සංඛ්‍යා සටහන II (ඌ) I

**ලංකාවේ ජාත්‍යන්තර ගනුදෙනු**

| වර්ෂය | අපනයන | ආනයන | වෙළෙඳ ශේෂය | ශුද්ධ සේවා | වර්තන ගිණුමේ ශේෂය | දිගුකාලීන ප්‍රාග්ධන (ශුද්ධ) (ආ) | මූලික ශේෂය | කෙටි කාලීන ප්‍රාග්ධන (ශුද්ධ) (ඇ) | වැරදීම් හා අත් හැරීම් | විදේශීය වත්කම්වල වෙනස (−) ඉහළ යාම | කාලච්ඡේදය අවසානයේදී මුළු විදේශීය වත්කම් | වත්කම් (රන් පවුම් නිදහ අරමුදල් හැර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1957 | 1,669 | 1,764 | − 95 | − 100 | − 195 | −18 | −213 | − 1 | − | − 214 | 1,062 | 973 |
| 1958 | 1,624 | 1,713 | − 89 | − 64 | − 153 | + 8 | −145 | +32 | − 16 | − 129 | 933 | 838 |
| 1959 | 1,773 | 1,958 | − 185 | − 23 | − 208 | +32 | −176 | − | + 1 | − 175 | 734 | 655 |
| 1960 | 1,796 | 2,006 | − 210 | − 10 | − 220 | +22 | −198 | −24 | + 29 | − 193 | 541 | 458 |
| 1961 | 1,707 | 1,794 | − 87 | − 7 | − 94 | +11 | − 83 | +93 | − 19 | − 9 | 532 | 441 |
| 1962 | 1,763 | 1,906 | − 143 | + 3 | − 140 | +39 | −101 | +42 | + 31 | − 28 | 504 | 407 |
| 1963 | 1,708 | 1,869 | − 161 | − 7 | − 168 | +80 | − 88 | +42 | + 4 | − 42 | 462 | 359 |
| 1964 | 1,764 | 1,957 | − 193 | + 45 | − 148 | +66 | − 82 | +40 | − 9 | − 51 | 351 | 305 |

(අ) ලැබී ඇති හා ගෙවා ඇති විනිමය ප්‍රමාණය අනුව සකසා ඇති විනිමය පාලන සංඛ්‍යා තොරතුරු අනුව.

(ආ) පෞද්ගලික හා රජයේ දිගුකාලීන ප්‍රාග්ධන සංචලන (ශුද්ධ) ඇතුළත්වේ. බැර ශේෂ මෙසේය. 1957–රුපියල් කෝටි 2·3, 1958–රුපියල් කෝටි 2·3, 1959–රුපියල් කෝටි 4·2, 1960–රුපියල් කෝටි 2·7, 1961–රුපියල් කෝටි 2·4, 1962–රුපියල් කෝටි 4·6, 1963–රුපියල් කෝටි 8·2, 1964–රුපියල් කෝටි 7·9. මේ සංඛ්‍යා වලින් ජා. ප්‍ර. ස, බැ., අ. එ. ජ. කැනඩා, ජර්මන් ඒකාබද්ධ සමූහාණ්ඩුව එ. ස. සෝ. ස., චීනය, එක්සත් රාජධානිය ආදී රටවල දිගු කාලීන ණය වලින් ගනු ලැබූ ප්‍රමාණයන් පිළිබිඹු වෙයි.

(ඇ) ද්විපාර්ශවීය වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම් යටතේ වගකීම් වල වෙනස්වීමද, ජනනිති 480 ප්‍රතිපාර්ශවීය අරමුදල් වෙළෙඳ බැංකු විදේශිනට ඇති වගකීම් හා අරමුදලෙන් ගන්නා මුදල් ඇතුළත් වෙයි. 1964 සංඛ්‍යාවට හාල් ආනයනය සඳහා බුරුමයට දිය යුතු ප්‍රමාණය ඇතුළත් වෙයි.

(ඈ) වරකට රුපියල් කෝටි 5·38 බැගින් 1961 අප්‍රේල් මාසයේදී හා 1962 පෙබරවාරි මාසයේදී ලබාගත් මුදල් ඇතුළත් වෙයි.

(ඉ) තිබෙන රන් පවුම් නිදහ් අරමුදල් වලින් 1959 ගෙවන ලද රුපියල් කෝටි 2·04 සහ 1964 දී ගෙවන ලද රුපියල් කෝටි 6·0 ඇතුළත් නොවේ.

1964 දී දක්නට නොලැබින. එයට හේතු වූයේ 1963 දී රුපියල් කෝටි 8·0 ක්වූ දීර්ඝකාලීන ශුඬ ප්‍රාග්ධන ලැබීම් ප්‍රමාණය 1964 දී රුපියල් කෝටි 6·6 දක්වා පහළ වැටීමය. 1964 දී රජයේ දීර්ඝකාලීන ශුඬ ප්‍රාග්ධන ලැබීම් රුපියල් කෝටි 6·74 ක් විය. 1963 දී එය රුපියල් කෝටි 7·54 ක් වූයේය. ලංකාවේ ගෙවුම් ශේෂ ගිණුමේ "මූලික හිඟයෙහි" 1964 දී රුපියල් කෝටි 8·2 ක හිඟයක් පිළිබිඹු විය. 1963 දී වූ හිඟය රුපියල් කෝටි 8·8 ක් විය. මෙම මූලික හිඟය, පියවා ගනු ලැබුයේ රුපියල් කෝටි 4·0 ක කෙටිකාලීන විදේශීය වගකීම් ඇති කර ගැනීමෙන් හා ලංකාවේ විදේශීය වත්කම් රුපියල් කෝටි 5·1 කින් අඩුකර ගැනීමෙනි. (තිබෙන රන් පවුම් ණය නිදන් අරමුදලෙන් රුපියල් කෝටි 6·0 ක රන් පවුම් ණය ආපසු ගෙවීම මෙයට ඇතුළත් නොවේ.) 1964 දී මූලික හිඟයෙන් සියයට 62 ක් විදේශීය වත්කම් මගින් පියවා ගන්නා ලදී. 1962 හා 1963 දී එසේ විදේශීය වත්කම්වලින් පියවාගත් ප්‍රමාණය පිළිවෙලින් සියයට 28 ක් හා 48 ක් විය.

**වෙළෙඳ භාණ්ඩ ගිණුම.**

ලංකාවේ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ ශේෂය (ගෙවීම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු අනුව) 1964 දී තවදුරටත් රුපියල් කෝටි 3·20 කින් රුපියල් කෝටි 19·30 දක්වා පහළ වැටුනේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ අපනයන මිල සාමාන්‍යයෙන් නොවෙනස්වම වාගේ පවතිද්දී ආනයන මිල සියයට 1·9 කින් වැඩි-වීම නිසා වෙළෙඳ අනුපාතයේ ඇතිවූ සියයට 3·4 ක අවාසිදායක වෙනස්වීමය. ආනයන මිල වැඩිවූයේ ප්‍රධාන වශයෙන් 'ආහාර පාන' හා 'ආයෝජන භාණ්ඩ' වර්ගයන්හිය. මූලික වශයෙන් අපනයන වල වටිනාකම රුපියල් කෝටි 5·6 කින් රුපියල් කෝටි 176·40 දක්වා වැඩිවිය. මෙයට හේතුවූයේ සියලුම අපනයන වර්ගවල සාමාන්‍ය මිල නොවෙනස්ව පසුගිය වර්ෂයේ මට්ටමෙහිම පැවතුනද, අපනයන පරිමාව සියයට 7·2 කින් වැඩිවීමය. ලංකාවේ මුළු විදේශීය විනිමය ඉපැයුමෙන් තුනෙන් දෙකොටසක් පමණ ලබාදෙන තේ අපනයන පරිමාව නොනැවති පැවතියේ නම් 1964 අපනයන වල වටිනාකම මීට බොහෝසෙයින් වැඩි වන්නට ඉඩ තිබින. තේ අපනයන පරිමාව පහළ වැටීමට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ අයහපත් කාලගුණය නිසා නිෂ්පාදනය අඩුවීම හා වර්ෂය අවසානයේදී ලංකාවේ උතුරු හා නැගෙනහිර, වෙරළේ ඇතිවූ සුළිසුළං හේතුකොටගෙන තේ තොග රාශියක් විනාශවී යාමය. තවද, රබර් අපනයන පරිමාව සියයට 21 කින් වැඩිවුවද රබර්වල සාමාන්‍ය මිල සියයට 7 කින් පහළ වැටීම නිසා ඒ වාසිය තරමක් දුරට මැකී ගියේය. එහෙත් පොල් නිෂ්පාදිත අපනයන පරිමාව ලසියයට 33 කින් වැඩිවීමත් සමගම සාමාන්‍ය මිලද සියයට 3 කින් වැඩිවූයේය.

1964 දී ආනයනවල වටිනාකම රුපියල් කෝටි 8·9 කින් රුපියල් කෝටි 195·7 දක්වා වැඩිවිය. එම ආනයන වැඩිවීමට හේතුවූයේ ද්‍රව්‍යවලින් කෙරෙන පරිත්‍යාග (රුපියල් කෝටි 3·4 ක වැඩිවීමක්) හා පෞද්ගලික අංශයේ (රජයේ සමායතනද ඇතුළුව) ආනයන (රුපියල් කෝටි 5·0 ක වැඩිවීමක්) වැඩිවීමත් සමගම සහල්, පිටි, හා සීනි ආනයන රුපියල් කෝටි 3·7 කින් වැඩිවීමය. රජයේ අනිකුත් ආනයන රුපියල් කෝටි 2·71 කින් පහළ වැටීම හේතුකොට එකී වැඩිවීම තරමක් දුරට මැකී ගියේය. ද්‍රව්‍ය වලින් ලැබුන පරිත්‍යාගවලට ප්‍රධාන වශයෙන්ම අයත්වූයේ චීනයෙන් ලැබුන රෙදිපිළි (රුපියල් කෝටි 2·0 ක් වටිනා) හා අමෙරිකා එක්සත් ජනපදයෙන් ලැබුන පිටි (රුපියල් කෝටි 2·5 වටිනා) ඇදිහැස පිටිය. පෞද්ගලික අංශයේ හා රජයේ සමායතන විසින් කැරුන ආනයන වැඩිවූයේ රෙදිපිළි, මාළු, හා මාළුවලින් පිළියෙලකරන ලද වෙනත් නිෂපාදිත, කුළුබඩු හා පොහොර ආනයන වැඩිවීම හේතුකොටගෙනය. එහෙත්

ප්‍රාග්ධන භාණ්ඩ හා අමු ද්‍රව්‍ය (මෙයට යකඩ, වානේ, ප්‍රවාහණ උපකරණ හා යන්ත්‍රසූත්‍ර ද ඇතුළත්ය.) ආනයන වටිනාකම පහළ වැටීම හේතුකොටගෙන පෙරකී වැඩිවීම් තරමක් දුරට මැකී ගියේය.

ඉහත සඳහන් පරිදි, 1964 දී ලංකාවේ ගෙවුම් ශේෂය අවාසි සහගත වීමට ප්‍රධානම සාධකය වූයේ ලංකාවේ වෙළෙඳ අනුපාතය අවාසිදායක අන්දමට වෙනස්වීමය. අපනයන වල සාමාන්‍ය මිල මට්ටම නොවෙනස්වම 1963 මිල මට්ටමෙහිම පැවතින. 1963 මිල මට්ටම 1960 මිල මට්ටමට වඩා සියයට 11 කින් අඩුය. අනෙක් අතට, ආනයන මිල මට්ටම සියයට 2 කින් වැඩිවිය. මෙය 1957 න් පසු ඇතිවූ ඉහළම මිල මට්ටම විය. ආනයන මිල වැඩිවීම විශේෂයෙන්ම බලපෑවැත්වූයේ සමුච්චිත ආනයන වියදමෙහි ප්‍රධාන කොටසක් කෙරෙහිය. එනම් 1964 දී මුළු ආනයන වටිනාකමින් අඩකටත් වැඩිවූ ආහාර පාන කොටස කෙරෙහිය. ඉහත සඳහන් කළ පරිදි ආහාර පානවල සාමාන්‍ය මිල, 1963 මිල මට්ටමට වඩා සියයට 8 කින් වැඩිවූ අතර ප්‍රධාන වශයෙන් සීනිවලද තරමක් දුරට සහල් හා පිටිවලද මි. ර. ගැ. මිල වැඩිවීමක් පිළිබිඹු විය. එසේ වුවද, එකී වැඩිවීම් තරමක් දුරට මැකී යන පරිදි රෙදි පිළිවල (සියයට 3 කින්), අන්තර් භාණ්ඩවල (සියයට 5 කින්) හා ආයෝජන භාණ්ඩවල (සියයට 2 කින්) සාමාන්‍ය මිල පහළ වැටුනේය. මෑත වර්ෂ වලදී ආනයනය කරන ලද පාරිභෝගික භාණ්ඩ සඳහා වූ මුළු පැහැදමෙහි සැලකිය යුතු පහළ වැටීම් ඇතිවීමට හේතු වූ දැඩි ආනයන පාලනයන් පිළිබඳව සලකා බලන කල, මෙම ශීර්ෂ වල මිල පහළ වැටීම හේතු කොට ගෙන ගෙවුම් ශේෂය කෙරෙහි ඇති වූ ශුද්ධ බලපෑම එතරම් සැලකිය යුතු නොවේ. 1964 දී ආහාර පාන හා රෙදිපිළි හැර අනෙකුත් පාරිභෝගික භාණ්ඩ වල ආනයන මිල ද සියයට 2·4 කින් වැඩිවිය මෙය, 1964 දී ලංකාවේ ආනයන වියදම වැඩිවීමට හා ගෙවුම් ශේෂ දුෂ්කරතාවලට තුඩුදුන් තවත් සාධකයක් විය. 1964 ලංකාවේ අත් දැකීම් අනුව, වෙළෙඳ ශේෂ මට්ටම තීරණය කිරීමෙහි ලා වෙළෙඳ අනුපාතයෙන් තවමත් ඉතා වැදගත් බලපෑමක් ඇතිවන බව පෙනීයයි. තවද, නිෂ්පාදනය වැඩිකොට අපනයන වැඩි කිරීමෙන් හා ප්‍රමාණාත්මක සීමාකිරීම් මාර්ගයෙන් ආනයන අඩුකිරීමෙන් ගෙවුම් තත්ත්වය සමබර කිරීමට ලංකාව විසින් දරනු ලබන දැඩි උත්සාහය නිශ්ඵල කිරීමට තරම් වෙළෙඳ අනුපාතය සමත් බවත් මේ වර්ෂයේ අත්දැකීම්වලින් පෙනී යයි.

**අදිසි ගිණුම**

සංඛ්‍යා සටහන II (ඉ) 2

**1963 සහ 1964 ජංගම අදිසි**

රුපියල් දශලක්ෂ

| | 1963 | | | 1964 (අ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **සේවා** | 210·5 | 230·3 | –19·8 | 181·2 | 175·5 | +5·7 |
| මුදල් නොවන රන් සංචලන (ශුද්ධ) | – | 1·9 | – 1·9 | – | 1·6 | – 1·6 |
| ප්‍රවාහණය | 108·3 | 33·1 | +75·2 | 102·9 | 30·3 | +72·6 |
| සංචාර | 5·9 | 22·0 | –16·1 | 5·6 | 13·5 | – 7·9 |
| ආයෝජන ආදයම | 15·7 | 68·2 | –52·5 | 12·2 | 46·3 | –34·1 |
| රජයේ වියදම් | 25·8 | 25·4 | + 0·4 | 23·2 | 19·9 | + 3·3 |
| අනෙකුත් සේවා | 54·8 | 79·7 | –24·9 | 37·3 | 63·9 | –26·6 |
| **සංක්‍රාම ගෙවුම්** | 49·5 | 36·3 | +13·2 | 82·0 | 42·4 | +39·6 |
| පෞද්ගලික ගෙවුම් | 5·9 | 36·3 | –30·4 | 5·6 | 42·4 | –36·8 |
| රාජකාරි | 43·6 | – | +43·6 | 76·4 | – | +76·4 |
| **එකතුව** | 260·0 | 266·6 | – 6·6 | 263·2 | 217·9 | +45·3 |

(අ) තාවකාලිකයි.

1964 දී ලංකාවේ අදිසි ගිණුමේ ශේෂයෙහි සැලකිය යුතු දියුණුවක් පිළිබිඹු විය. 1964 දී අදිසි ගිණුමේ රුපියල් කෝටි 4·53 ක අතිරික්තයක් ඇති විය. 1963 දී එහි රුපියල් කෝටි 0·66 ක හිඟයක් ඇතිවූ අතර, 1962 දී රුපියල් කෝටි 0·3 ක අතිරික්තයක් ඇති විය. 1964 දී අදිසි ගිණුමේ ශේෂයෙහි වර්ධනයක් ඇති වූයේ ප්‍රධාන වශයෙන්ම ආයෝජන ආදායමෙහි වූ ශුද්ධ හිඟය රුපියල් කෝටි 1·84 සිට රුපියල් කෝටි 3·41 දක්වා අඩු කිරීම හා සංක්‍රාම ගෙවුම්වල අතිරික්තය වැඩිවීම හේතු කොට ගෙනය. 1964 අගෝස්තු මාසයේදී පනවන ලද, ලාභාංශ, ලාභ හා ප්‍රාග්ධන පැවරුම් කල්තැබීමේ නීත්‍යානුකූල බලය, හේතුකොටගෙන ආයෝජන ආදායම් ගිණුම කෙරෙහි වාසිදායක බලපෑමක් ඇතිවූ නමුදු ලංකාවේ පහළ වැටෙමින් පවතින විදේශිය වත්කම් වලින් ඉපැයුනු ආදායම පහළ වැටීම නිසා එය තරමක් දුරට මැකී ගියේය 1964 දී විදේශ රාජ්‍ය වලින් ලැබුන ආධාර, රුපියල් කෝටි 3·28 කින් රුපියල් කෝටි 7·64 දක්වා වැඩිවිය. මෙයට ප්‍රධාන වශයෙන් ම, චීනයෙන් (රුපියල් කෝටි 3·28), කැනඩාවෙන් (රුපියල් කෝටි 1·4) හා අමෙරිකා එක්සත් ජනපදයෙන් (රුපියල් කෝටි 2·5) ලැබුන ආධාර ඇතුළත් වෙයි. මෙම ආධාර ලැබුනේ භාණ්ඩ වශයෙනි. පැමිණි හා ඉන්ධන ලබාගත් නැව් ප්‍රමාණය සුළු වූ හෙයින් ලංකාවේ වරාය වලින් ලද ඉපැයුම් රුපියල් කෝටි 0·26 කින් අඩුවීමෙන් ද සංක්‍රමනිකයන්ගේ පැවරුම් රුපියල් කෝටි 0·61 කින් රුපියල් කෝටි 4·24 දක්වා වැඩි වීමෙන් ද අදිසි ගිණුමෙහි වූ ලාභ වෙනස් විය.

**හිඟය පියවීම**

සංඛ්‍යා සටහන II (උ) 3

**ගෙවීමට ඇති ලංකාවේ විදේශීය වගකීම්[1] (දළ)**

රුපියල් දශ ලක්ෂ

| | 1963 | 1964 | වෙනස |
|---|---|---|---|
| 1. ලංකාවෙන් අයවිය යුතු ගෙවීම් ගිවිසුම් ශේෂ .. | 49·6 | 69·3 | + 19·7 |
| 2. ජා. මු. අරමුදලෙන් ගත් ණය .. | 107·6 | 107·6 | — |
| 3. රන් පවුම් ණය .. | 167·9 | 107·9 | — 60·0 |
| 4. ණයට ගෙන පියවා නොමැති අනෙකුත් විදේශීය ණය2 .. | 263·2 | 330·6 | + 67·4 |
| 5. පමාකළ ගෙවුම (සහල්) .. | — | 37·3 | + 37·3 |
| එකතුව .. | 588·3 | 652·7 | + 64·4 |

1 විදේශිය විනිමය වලින් ගෙවීමට ඇති වගකීම් වලට ජන නීති 480 යටතේ ඇති ප්‍රතිපාර්ශවීය අරමුදල් ශේෂ සහ වෙළෙඳ බැංකු වෙනැති අනේවාසික ශේෂ ඇතුළත් නොවේ. එවැනි ශේෂ 1964 දී රුපියල් කෝටි 8·68 සිට රුපියල් කෝටි 8·37 දක්වා රුපියල් කෝටි 0·31 කින් අඩු විය.

2 ජා. ප්‍ර. ස. බැංකුව, අමෙරිකා එක්සත් ජනපදය, එ. ස. සෝ. සංගමය, චීනය, බටහිර ජර්මනිය කැනඩාව යනාදියෙන් ගන්නා ලද ණය මුදල් මෙයට අයත් වෙයි.

ඉහත සඳහන් කළ පරිදි 1964 දී වෙළෙඳ භාණ්ඩ ගිණුමේ ඇතිවූ හිඟය රුපියල් කෝටි 14·8 ක් විය. 1963 දී හිඟය රුපියල් කෝටි 16·8 ක් විය. රුපියල් කෝටි 6·6 ක දිගු කාලීන ප්‍රාග්ධනයක් මෙරටට ගෙන ඊමෙන් (ශුද්ධ) මේ හිඟයෙන් කොටසක් පියවාගනු ලැබිය. මෙය හේතු කොට ගෙන රුපියල් කෝටි 8·2 තෙක් අඩුවූ මූලික හිඟය පියවා ගන්නා ලද්දේ කෙටි කාලීන වගකීම් වැඩි කිරීමෙන් හා

විදේශීය වත්කම් උපයෝගි කර ගැනුමෙනි. 1964 දී ලැබුන දිගු කාලීන දළ ප්‍රාග්ධනය රුපියල් කෝටි 7·85 ක් විය. 1963 දී එය රුපියල් කෝටි 8·17 ක් විය. දිගු කාලීන ණය සියල්ලම විශෙෂ සංවර්ධන ක්‍රම වලට හෝ ණයහිමි රටවල ආනයන වලට හෝ සම්බන්ධ වූ ඒවා විය.

1964 දී දිගු කාලීන ණය ලැබුනේ ජා. ප්‍ර. ස. බැංකුවෙන් (රුපියල් කෝටි 1·48), ඒ. ස. සෝ. සංගමයෙන් (රුපියල් කෝටි 3·3), චීනයෙන් (රුපියල් කෝටි 1·42), බටහිර ජර්මනියෙන් (රුපියල් කෝටි 0·73), එක්සත් රාජධානියෙන් (රුපියල් කෝටි 0·62), අමෙරිකානු එක්සත් ජනපදයෙන් (රුපියල් කෝටි 0·11), කැනඩාවෙන් (රුපියල් කෝටි 0·14) හා යුගෝස්ලාවියාවෙනි (රුපියල් කෝටි 0·05). 1964 දී ජා. ප්‍ර. ස. බැංකුවෙන් රුපියල් කෝටි 1·48 ක ණය මුදලක් ලැබුනේ නෝටන් බ්‍රිජ් ජල විදුලි යෝජනා ක්‍රමය හා ග්‍රෑන්ඩ්පාස්හි දෙවන තාප බල මධ්‍යස්ථානය සඳහා වැය කිරීමට ගිවිස ගන්නා ලද රුපියල් කෝටි 18·5 ක මුදලේ කොටස් වශයෙනි. ඒ. ස. සෝ. සංගමයේ ණය දෙන ලද්දේ පුළුල්වූද, විවිධවූද සංවර්ධන යෝජනා ක්‍රම සඳහාය. ඒවාට, අනෙකුත් යෝජනා ක්‍රම අතර, ගංගා නිම්න සංවර්ධන, කෘෂිකර්මාන්තය සඳහා කැලෑඑළි කිරීම සහ පොහොර නිෂ්පාදනය සඳහා යෝජිත කර්මාන්ත ශාලාව ඇතුලත් වෙයි. චීන ණය මුදල දෙන ලද්දේ අතිරේක සහල් ආනයන සඳහා මුදල් යෙදවීමටය. බටහිර ජර්මනියෙන් ගත් ණය ලංකා සිමෙන්ති සංයුක්ත මංඩලය සඳහා යොදවන ලද අතර එක්සත් රාජධානියෙන් ලද ණය විදුලි සන්දේශ පහසුකම් ව්‍යාප්ත කිරිම සඳහා යොදවන ලදී.

1964 දී රට තුලට ඇදී ආ පෞද්ගලික දිගු කාලීන ප්‍රාග්ධනය (දළ) රුපියල් කෝටි 0·43 ක් විය. 1963 දී එය රුපියල් කෝටි 0·87 ක් විය. 1964 දී රටින් පිටට ඇදී ගිය ප්‍රමාණය රුපියල් කෝටි 0·59 ක් වූ අතර 1963 දී එය රුපියල් කෝටි 0·35 ක් විය. මේ අනුව, පෞද්ගලික දිගු කාලීන ප්‍රාග්ධන ශේෂයෙහි (ශුද්ධ) රුපියල් කෝටි 0·16 ක හිඟයක් දක්නට තිබුණි. 1963 එහි රුපියල් කෝටි 0·49 ක අතිරික්තයක් ඇති විය. පසුගිය වර්ෂවලදී මෙන්ම මේ වසරේදීත් මෙරටට පෞද්ගලික ප්‍රාග්ධන ඇදී ආවේ ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික අංශයේවූ අනුමත කරන ලද කර්මාන්ත සඳහාය. 1964 දී පෞද්ගලික ප්‍රාග්ධනය රටින් පිට ඇදී යාමට හේතු වූයේ වර්තමාන විවිධ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරිම සඳහා ලංකාවේ පිහිටුවා ඇති විදේශීය ව්‍යාපාරික ආයතන, ප්‍රධාන කාර්‍ය්‍යාලවලින් ණයට ගත් ප්‍රාග්ධනය ආපසු ගෙවීමය.

1964 දී ලංකාවේ මූලික හිඟය පියවා ගැනීම පහසු වූයේ රුපියල් කෝටි 4·0 ක කෙටි කාලීන විදේශීය වගකීමක් ඇති කර ගැනීම හා ලංකාවේ විදේශිය වත්කම් රුපියල් කෝටි 5·10 කට සමාන ප්‍රමාණයකින් (රුපියල් කෝටි රු. 6·0 ක රන් පවුම් ණය ආපසු ගෙවීමක් මෙයට ඇතුලත් නොවේ) අඩු කිරීමෙනි. කෙටි කාලීන වගකීම් රුපියල් කෝටි 4·0 කින් වැඩි කැරුනේ චීනය (රුපියල් කෝටි 1·51) හා ඒ. ස. සෝ. සංගමය (රුපියල් කෝටි 0·76) සමග වූ ගෙවීම් ගිවිසුම් වල ලංකාවේ බැඳීම් වැඩිකර ගැනීමක් හා බුරුමය සමග රුපියල් කෝටි 3·73 ක පමා කළ ණය ගෙවීම් ගිවිසුමක් ඇති කර ගැනීමෙනි. අනෙක් අතට, ලංකාවේ ව්‍යාපාරික ආයතන වලින් පිටරට ව්‍යාපාරික ආයතන වලට ණය වී තිබූ ශේෂ ඇතුලත්, කෙටි කාලීන පෞද්ගලික ප්‍රාග්ධන වගකීම් රුපියල් කෝටි 1·3 කින් අඩුවූයේය. මෙයට ඉඩ කඩ සැලසුනේ දැඩි ආනයන පාලනය හේතුකොට ගෙන 1964 දී මෙම ව්‍යාපාරික ආයතන විසින් කරන ලද ආනයනයන් තව දුරටත් පහල වැටීමෙනි.

### ප්‍රාදේශීය ගනු දෙනු පිළිවෙල

සංඛ්‍යා සටහන 11 (ඉ) 4

**1963 සහ 1964 වර්තන ගිණුම්, මුදල් කලාප අනුව**

රුපියල් දශ ලක්ෂ

| | 1963 | | | 1964 (තාවකාලික) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| 1. ඩොලර් කලාපය .. | 275·1 | 106·1 | +169·0 | 282·8 | 120·2 | +162·6 |
| 2. රන් පවුම් කලාපය .. | 1,022·9 | 1,162·7 | —139·8 | 970·4 | 1,089·9 | —119·5 |
| (i) එක්සත් රාජධානිය .. | 628·8 | 602·5 | + 26·3 | 573·7 | 526·3 | + 47·4 |
| (ii) ඉන්දියාව .. | 57·4 | 213·7 | —156·3 | 70·1 | 228·4 | —158·3 |
| (iii) අනෙකුත් .. | 336·7 | 346·5 | — 9·8 | 326·6 | 335·2 | — 8·6 |
| 3. ඩොලර් හෝ රන්පවුම් නොවන කලාප | 668·6 | 864·6 | —196·0 | 773·8 | 964·5 | —190·7 |
| (i) අනෙකුත් ආ. ස. ස. සා. රටවල්* .. | 186·2 | 232·8 | — 46·6 | 195·1 | 269·0 | — 73·9 |
| (ii) චීනය .. | 114·1 | 146·1 | — 32·0 | 155·3 | 182·4 | — 27·1 |
| iiii) සෝවියට් කලාපය .. | 109·3 | 159·3 | — 50·0 | 165·9 | 207·0 | — 41·1 |
| (iv) අනෙකුත් . | 259·0 | 326·4 | — 67·4 | 257·5 | 306·1 | — 48·6 |
| එකතුව .. | 1,966·6 | ,2133·4 | —166·8 | 2,027·0 | 2,174·6 | —147·9 |

* ඔස්ට්‍රියාව, බෙල්ජියම, ඩෙන්මාර්කය, ප්‍රංසය, ජර්මන් සමූහාණ්ඩුව, ග්‍රීසිය, ඉතාලිය, නෙදර්ලන්තය, නෝර්වේ, පෘතුගාලය, ස්විඩනය,ස්පාඤ්ඤය හා ස්විට්සර්ලන්තය මෙයට අයත්වෙයි.

ලංකාවේ වර්තන ගිණුමේ ප්‍රාදේශීය ශේෂය පසුගිය වර්ෂයේ පිළිවෙලටම පැවතින. ඩොලර් කලාපය සමග සිරිත් පරිදි ඇතිවන අතිරික්තය රුපියල් කෝටි 0·64 කින් අඩුවූ අතර රන්පවුම් කලාපය සමග ඇතිවූ හිඟයද 1963 රුපියල් කෝටි 13·98 ක් වූයේ 1964 දී රුපියල් කෝටි 2·03 කින් රුපියල් කෝටි 11·95 දක්වා අඩුවිය. රන් පවුම් කලාපයේ එක්සත් රාජධානියේ 1963 දී ඇතිවූ රුපියල් කෝටි 2·63 ක අතිරික්තය 1964 දී රුපියල් කෝටි 4·74 දක්වා වැඩිවිය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ භාණ්ඩ වෙළෙඳම හා වර්තන අදිසි ගනුදෙනු වලින් උද්ගත වන එක්සත් රාජධානිය වෙත කැරුන ගෙවීම් අඩුවීමය. 1963 වර්ෂයත් සමග සසඳ බලන කල, 1964 දී ඉන්දියාව හා රන්පවුම් කලාපයේ ඉතිරි රටවල් සමග ඇතිවූ හිඟය නොවෙනස්වම වාගේ පැවතින. ඩොලර් හෝ රන්පවුම් හෝ නොවන කලාපයන් සමගවූ හිඟය 1963 දී රුපියල් කෝටි 19·6 ක් විය. 1964 දී එය රුපියල් කෝටි 0·84 කින් රුපියල් කෝටි 18·76 දක්වා සුළුවශයෙන් අඩුවිය. ආර්ථික සහයෝගතා හා සංවර්ධන සංවිධානයේ අනෙකුත් රටවල් සමග ඇතිවූ හිඟය රුපියල් කෝටි 2·73 කින් වැඩිවිය. සෝවියට් කණ්ඩායම හා චීනය සමගවූ මුළු හිඟය, 1964 දී රුපියල් කෝටි 6·82 දක්වා රුපියල් කෝටි 1·38 කින් පහළ වැටුණි. මෙයට හේතු වූයේ මේ වර්ෂයේදී ගෙවීම්, රුපියල් කෝටි 8·41 කින් වැඩි වුවද, ලැබීම්.රුපියල් කෝටි 9·78 කින් වැඩිවීමෙනි.

### විදේශීය සංචිත

1964 දී ලංකාවේ විදේශීය වත්කම් (රන් පවුම් ණය නිදන් අරමුදල් හැර) රුපියල් කෝටි 5·41 කින් පහළ වැටිණි. 1963 දී විදේශීය වත්කම් පහළ වැටුනේ රුපියල් කෝටි 4·79 කිනි. මේ වර්ෂයේ මුල්භාගයේදී විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස රුපියල් කෝටි 6·86 කින් පහළ වැටිණි. මෙයට හේතුවූයේ, විශේෂයෙන්ම ආහාර ද්‍රව්‍ය ඇතුළත්වන, ආනයන සඳහා ගෙවීම් වැඩිවීමත් අපනයන වලින් ලද ඉපැයුම් අඩුවීමත්ය. එහෙත් මේ වර්ෂයේ දෙවන භාගයේදී විදේශීය සංචිත රුපියල් කෝටි 1·45 කින් ඉහළ ගියේය. මෙයින්, එම කාලච්ඡේදය තුළදී ගෙවුම් ශේෂ තත්ත්වයෙහි ඇතිවූ වර්ධනය පිළිබිඹු වෙයි. 1964 වර්ෂය අවසානයේදී රුපියල් කෝටි 30·47 ක්වූ මුළු විදේශ වත්කම් (රන් පවුම් ණය නිදන් අරමුදල් හැර) වලින් රුපියල් කෝටි 13·59 මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ ශේෂය විය. වර්ෂයේ අවසානය වන විට ජාත්‍යන්තර සංචිතයේ ද්‍රවශීල අරමුදල් රුපියල් කෝටි 4·97 ක් වූ අතර ඉතිරි කොටස ප්‍රධාන වශයෙන්ම විදේශීය සුරැකුම් පත් වලින් සමන්විත වූයේය. 1964 වර්ෂයේ අවසානය වන විට රුපියල් කෝටි 10·73 ක්ව පැවති වෙළෙඳ බැංකු වල විදේශීය ශේෂයන්ගෙන් මෙම ආයතන වල කාරක ශේෂයන් පිළිබිඹු වෙයි. මෙයින් රුපියල් කෝටි 5·37 ක් විදේශීය ශේෂයන් වූ අතර අපනයන බිල්පත් රුපියල් කෝටි 5·36 ක් විය.